# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,710 — 1966 අගෝස්තු 26 වැනි සිකුරාද — 1966.8.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 611 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| තනතුරු—ඇබෑර්තු .. .. .. .. | 612 | අය-වැය ලේඛන .. .. .. | 616 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 615 | දේපළ විකිණීම .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | 615 | මාර්ග කොමිටි දැන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් .. .. .. | 619 |



## පළාත් පාලන නිවේදන

එල්.ජී.—බී. 29/56.

### සුළු නගර සභා ආඥාපනත

#### 183 වන වගන්තිය යටතේ වූ ආඥාවයි

1957 අංක 2 දරන පනතින් සංශෝධිත (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 183 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේෂන් තිරුචෙල්වම් වන මම, ඉහතකී වගන්තිය යටතේ තිස්සමහාරාම නගරයට අදාළ ව පනවනු ලැබ, 1966 මැයි 6 වන දින අංක 14,694/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ආඥාව, එහි (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් මේ ආඥාවෙන්, 1966 අගෝස්තු මස 8 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරමි:—

"(ආ) ඒ ආඥාපනත යටතේ තිස්සමහාරාම නගරය සඳහා අලුතෙන් සුළු නගර සභාවක් සංස්ථාපනය කරන තුරු සහ ඒ සභාව විසින් සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලබන තෙක් ඒ නගරයේ කටයුතු පරිපාලනය කිරීම පිණිස ද, ඒ කාර්‍ය සඳහා ඒ ආඥාපනත යටතේ සුළු නගර සභාවක බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටු කිරීම පිණිස ද පළාත් පාලන සහකාර කොමසාරිස් මද්දුම මුතුගලගේ ලයනල් මාටින් පෙරේරා මහතා විශේෂ කොමසාරිස් වශයෙන් පත් කරමි."

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

8–1272—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින් ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදාහරින්නට තමන් සූදානම්ව සිටින්ද නැත්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘතිපත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේ දී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සකලාකාරයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

### ————තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය: ————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් හැඳුනුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයන් සමඟ :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දැරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිස්තර (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—

සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශෙෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්බරය සහ වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොපමණ ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපදේශකත්වය දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### තුන්වන ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි තනතුරු

ඉහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය රු. 1,980—120—රු. 3,180 (වාර්ෂික). රු. 2,460 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉම.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) අයදුම්කරුවෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තාහ ;

(ආ) අයදුම්කරුවෝ ලාංකික විය යුත්තාහ ;

(ඇ) 1966.9.14 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි ;

(ඈ) පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ඔවුනට තිබිය යුතුයි :—

(1) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි (සිවිල්) අවසාන සහතිකය ;

(2) නාගරික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨ මාලාව) ;

(3) ගොඩනැගිලි කර්මාන්තය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨ මාලාව) ;

(4) ගොඩනැගිලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයේ අවසාන සහතිකය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව) ;

(5) උප පරීක්ෂක ශ්‍රේණියට උසස් කිරීම සඳහා ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ පරිපාලන ඉංජිනේරු වරුන්ගේ දෙපාර්තමේන්තු විභාගය ;

(6) සමාන හෝ උසස් විභාගයක්.

ඉහත සඳහන් වැටුප් ක්‍රමය මත පිහිටුවනු ලැබීම සඳහා අයදුම්කරුවන්ට සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ අවුරුදු 3 ක ප්‍රායෝගික පළපුරුද්ද තිබිය යුතුයි. ජල කර්මාන්තය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

4. තුන් අවුරුද්දකට අඩු ප්‍රායෝගික පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ගේ ආරම්භක වැටුප් මෙසේය :—

| | | |
|---|---|---|
| අවුරුදු 2 ක ප්‍රායෝගික පළපුරුද්ද | ... | වර්ෂයකට රු. 1,860 |
| අවුරුදු 1 ක ප්‍රායෝගික පළපුරුද්ද | ... | වර්ෂයකට රු. 1,620 |
| ප්‍රායෝගික පළපුරුද්ද නැති අය | ... | වර්ෂයකට රු. 1,500 |

5. නියමිත වර්ග ගණනක් සේවය කිරීම සඳහා ඇප ඔප්පුවක් හෝ ගිවිසුමක් අත්සන්කොට ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවයේ නියුතු නිලධාරීන් ඉල්ලුම්කර සිටිය යුත්තේ යම්හෙයකින් III ශ්‍රේණියේ කර්මාන්ත අධිකාරි තනතුරක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඇප ඔප්පුවේ හෝ ගිවිසුමේ නියමයන් ඉටු කිරීමට හැකි තත්ත්වයක ඔවුන් සිටියහොත් පමණි.

6. අවශ්‍ය කාර්මික සුදුසුකම් ඇති පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ අයදුම්පත්‍ර වයස ගැන නියමය නොතකා සලකා බලනු ලැබේ. එබඳු අයගේ අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නාගරික කොමසාරිස්ගේ හෝ සභාපතිතුමාගේ මාර්ගයෙනි.

7. අයදුම්පතක් තැපෑලේදී නැතිවූ බවට, ප්‍රමාදවූ බවට කෙරෙන කිසිම චෝදනාවක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය එනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමුම එවැනි අවදානමකට මුහුණ දෙති.

8. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

9. ඉල්ලුම්පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙලකොට 1966.9.14 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

10. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

11. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සම්බන්ධ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, පළාත් පාලන ආයතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

12. සුදුසුකම් ලත් ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

————,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති

1966 අගෝස්තු මස 19 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

8–1279—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### ජලකර්මාන්ත පරීක්ෂක තනතුරු

පහත සඳහන් තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. වැටුප් පරිමාණය.—මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය, වර්ෂයකට රුපියල් 1,860—17 × 120 සහ 8 × 180—රුපියල් 3,340 කි. මෙම වැටුප් පරිමාණයෙහි වර්ෂයකට රුපියල් 3,420 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් ද, වර්ෂයකට රුපියල් 4,800 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

3. කොළඹ නගර සභාවේ ඉංජිනේරු ඕවර්සියර්වරුන්ගෙන් සහ අවශේෂ ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි ජලකර්මාන්ත පරීක්ෂකවරුන්ගෙන් පමණක් අයදුම්පත් භාරගනු ලැබේ. අයදුම්කරුවනට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(i) සත් අවුරුද්දක ප්‍රායෝගික පළපුරුද්ද, යටත් පිරිසෙයින් එයින් අවුරුදු දෙකක් ජලකර්මාන්තය පිළිබඳව විය යුතුයි ; නැතහොත්

(ii) ජලකර්මාන්තය පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු පහක පළපුරුද්ද.

අයදුම්කරුවන්ට, පහත සඳහන් ශිල්පීය සුදුසුකම්වලින් ද එකක් වත් තිබිය යුතුය :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයයේ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය (සිවිල්).

(ආ) ලංකා කාර්මික විද්‍යාලයයේ නාගරික ඉංජිනේරු ශිල්පය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨ මාලාව) පිළිබඳ අවසාන සහතිකය.

(ඇ) ලංකා කාර්මික විද්‍යාලයයේ ගොඩනැගිලි නිර්මාණය (තුන් අවුරුදු සන්ධ්‍යා කාල පාඨමාලාව) පිළිබඳ අවසාන සහතිකය; නැතහොත්

වෙනත් සමාන සුදුසුකමක්.

4. තෝරාගන්නා ලද අයදුම්කරුවන්ට, කොළඹ නගරයේ සිට සැතපුම් 10 ක අර්ධ විෂ්කම්භය ඇතුළත පදිංචි වන ලෙස නියම කරනු ලබන අතර, ජලකර්මාන්ත ඉංජිනේරු තැන විසින් නියම කරනු ලබන පරිදි ඒ ඒ අවස්ථාවල ලබුගම හෝ කලටුවාවේ මූලස්ථානවල රාජකාරි ඉටු කිරීමට නියම කෙරේ.

5. මේ ගැසට් පත්‍රයේ iv වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1966.9.14 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගනු ලැබූ අවසාන දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. යෝග්‍යතා ඇති ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 අගෝස්තු මස 18 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.

8-1278—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### ගිනිහට තනතුරු

ඉහත සඳහන් තනතුරුවලට පත් කිරීම සඳහා පහත නම් සඳහන් අය පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් සතුටින් තෝරා ගෙන ඇත :—

1. ඩබ්ලිව්. ඇම්. ජී. බණ්ඩා
2. ඇම්. එච්. ඩී. ඞී. ආතර් අප්පුහාමි
3. ඇස්. ටී. විජේරත්න
4. ඩබ්ලිව්. ජේ. ද ඇස්. රාජකරුණා
5. ටී. එච්. ඇම්. චන්ද්‍රසිරි
6. ඩබ්ලිව්. පී. විජයසිංහ
7. පී. ඒ. යූ. ආරියවන්ශ
8. එච්. ඩී. ජෝශප්
9. පී. ආර්. ඩයස්
10. යූ. ඩී. විමලසේන
11. ඇම්. ඇන්. එච්. ආරියරත්න
12. ඇම්. අබේරත්න
13. එච්. ඞී. සිරිසේන
14. ඞී. ජී. කුමාරදාස
15. එච්. ඒ. ඇස්. හපන්ගම
16. ඞී. ඒ. තිලකරත්න

2. තෝරාගෙන සිටින අයට වහාම පත්වීම් දීමට කොමිෂන් සභාව භාර නොගනී. අයදුම්පත් කැඳවන ලද ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව, කෙසේවෙතත්, පුරප්පාඩු ඇති වන විට ඒ ඒ අවස්ථාවන්හි පත්වීම් දෙනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1966 අගෝස්තු මස 16 වැනි දින,
තැ. පෙ. 530, කොළඹ.

8-1282—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඞී.—බී. 32/65

ප. පා. දෙ.—ජී. අයි. 9/40

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මැදපත්තු දකුණු ගම්සභාව විසින් පනවනු ලැබ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1966.7.21,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථා

(1) පහත දැක්වෙන ව්‍යාපාර අන්තරායදායක වූ ව්‍යාපාර වශයෙන් සැලකිය යුතුය :—

කොප්පරා සෑදීම
කබුක්ගල්, බොරළු හෝ කළුගල් සඳහා ගල්වළවල් හෑරීම.
කපාපු පොල් නිෂ්පාදනය කිරීම.
කොප්පරා ගබඩා කිරීම.
පිදුරු ගබඩා කිරීම.
මිනිරන් සකස් කිරීම හෝ ගබඩා කිරීම.
යන්ත්‍රානුසාරයෙන් පොල් තෙල් සිඳීම.
කෙඳි වගී තෙලීම හෝ ගබඩා කිරීම.
කපුපුලුන් ගබඩා කිරීම.
ඇවදඹු ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
ස්වර්ණාභරණ සෑදීම.
අම්ලකර වායුව මගින් ලෝකුරු වැඩ කරන යම් ව්‍යාපාරයක්.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
යන්ත්‍රසූත්‍රාදියෙන් තෙල් සිඳීම.
හුණුගල් ලබාගැනීම පිණිස වළක් කැණීම.
හුණු සකස් කිරීම හෝ ගබඩා කිරීම.
කම්හලක් තබාගැනීම.
සිසිල් බීම වගී සෑදීම.

(2) පහත දැක්වෙන ව්‍යාපාර අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතුය :—

ජාඩි හෝ කරවල ගබඩා කිරීම.
තොග ගණනේ විකිණීම සඳහා නරක් විය හැකි ආහාර හා ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම.
කොම්පෝස් පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම.
විනාකිරි සෑදීම.
සබන් සෑදීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
පූවක් වියලා සකස් කිරීම.
සතුන්ගේ ලේ හෝ අතුණු බහන් උණු කිරීම.
සතුන්ගේ සම් ගබඩා කිරීම.
සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම.
මාළු අයිස් දැමීම.
දැව දඹු පොහොර සකස් කිරීම.
රබර් ෂීට් හෝ ක්‍රේප් වියලීම හා සෑදීම.
කෘත්‍රිම පෝහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම සඳහා පාවිච්චි කරනු ලබන ද්‍රව්‍ය ගෝනි තුනකට වඩා ගබඩා කිරීම.
කෝඩා සෑදීම.
දුම් කොළ වියලා සකස් කිරීම.
සුරුට්ටු සෑදීම.
පැණි සෑදීම.
රා එකතු කරන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම.
බීඩි සෑදීම.
පොල්ලෙලි වළක් පවත්වාගෙන යාම.

(3) පහත දැක්වෙන ව්‍යාපාර අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර වශයෙන් සැළකිය යුතු ය :—

කෙඳි සායම් කිරීම.
ගඩොල් හෝ උළු පිච්චීම.
බැටරි පිරවීම.
හුණුගල් පිච්චීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ කැබලිවලට කැඩීම.

8–1297—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### බෙලිඅත්ත සුළු නගර සභාව

**මුදල් නීති රෙගුලාසි අංක 40(11) යටතේ අයදුම්පත**

### වර්ෂ 1966—අය-වැය කෙටුම්පත

1966 අයවැය ලේඛණයේ ඒ ඒ ශීර්ෂය යටතේ වෙන්කරන ලද මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂවලට මාරුකොට අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට 1966.6.21 වැනි දින මාසික සභා රැස්වීමේ යෝජනා අංක 5 අනුව සභා සම්මතවිය.

### 1 කොටස—සාමාන්‍ය

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| සී 4 නඩත්තු කිරීම ... ... ... | 150 | 0 |
| සී 8 ජීවනාධාර ... ... ... | 850 | 0 |
| ඩී 1 (එච්) කාණු දීර්ඝ කිරීම ... ... | 700 | 0 |
| | 1,700 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ 2 (බී) ගමන් ගාස්තු ... ... | 150 | 0 |
| ඒ 2 (ඊ) නීති ගාස්තු ... ... ... | 100 | 0 |
| ඒ 2 (ඇජ්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණගාස්තු හා වෙනත් වියදම් ... | 350 | 0 |
| සී 1 වැටුප් ... ... ... | 450 | 0 |
| ඩී 5 (ඒ) වැටුප් ... ... ... | 200 | 0 |
| ඩී 5 (සී) නඩත්තුව ... ... ... | 450 | 0 |
| | 1,700 | 0 |

### 2 කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී 4 (ඒ) වැටුප් හා දීමනා ... ... | 400 | 0 |
| ඊඩී 4 (බී) එළිමහනේ වැඩ කරණ සේවකයින් වැටුප් ... | 500 | 0 |
| | 900 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| ඊඩී 1 (බී) එන්ජින් තෙල් හා එන්ජින් කාමරයේ බඩු ... | 900 | 0 |
| | 900 | 0 |

1966.7.26 දින,
සුළුනගර සභා කාර්‍යාලය,
බෙලිඅත්ත

ඩබ්ලිව්. පී. සයිමන් සිල්වා,
සභාපති
බෙලිඅත්ත සුළු නගර සභාව,

අනුමත කරණ ලදී.

1966.8.12 දින,
මාතර

ඇම්. ඇල්. ඇම් පෙරේරා,
පළාත් පාලන සහකාර කොමසාරිස් පහළ දකුණු දිශාව.

8—1283—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

### දෙඩන්දූව උපනගර සභාව

**1966 හතරවැනි පරිපූරක අය-වැය ලේඛනය**

### 2 වැනි කොටස—විදුලිය

| වැය ශීර්ෂය | ගණන රු. | ශ. |
|---|---|---|
| ඊ. 2 (ඩී) විදුලි බලය සැපයීමේ ප්‍රධාන කම්බි නඩත්තු කිරීම ... | 6,000 | 0 |
| ඊ. 3 (ඒ) සේවය හා නිවාසවලට විදුලි කම්බි සම්බන්ධ කිරීම උපකරණ ... ... ... | 550 | 0 |
| | 6,550 | 0 |

1966 අගෝස්තු මස 10 වැනි දින පවත්වන ලද දෙඩන්දූව උපනගර සභාවේ විශේෂ රැස්වීමේ යෝජනා අංක 10 (1) යටතේ සභා සම්මත විය.

බී. ජේ. ජයවර්ධන,
සභාපති.

දෙඩන්දූව උප නගර සභාව,
1966 අගෝස්තු 12.

8–1293—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

## වේයන්ගොඩ සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (II) යටතේ අයදුම් පත්‍රයයි

### 1966 අය-වැය ලේඛනය

පහත දැක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් වැය ශීර්ෂවලින් රු. 1,850.00 වැඩිපුර වියදම් යටතේ සඳහන් වැය ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීමට 966.7.28 වෙනි දින පවත්වන ලද නගර සභා රැස්වීමේදී අංක 29 දරණ යෝජනාවෙන් සභා සම්මත කරගන්නා ලදී.

**ඉතිරි වැය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ 2 (ඩී) | තක්සේරු ගාස්තු ... ... | 100 | 0 |
| ඒ 2 (ඇෆ්) | ලිපි ද්‍රව්‍ය ආදිය ... ... | 500 | 0 |
| ඕ 7 | ඉඩම් සතු කර ගැනීම ... ... | 50 | 0 |
| ඩී 1 කේ. | කිරි විසිව කිරීමේ ගාස්තු. ... ... | 50 | 0 |
| ඩී 3 ඊ. | වැසිකිළි නඩත්තුව ... ... | 200 | 0 |
| ඩී 4 ඒ. | දෛනික වැටුප් ... ... | 120 | 0 |
| ඇෆ් 2 | නඩත්තුව ... ... ... | 300 | 0 |
| ද් 1 | ගිනි නාශක බඳුන් ... ... | 30 | 0 |
| ජේ 5 | නඩත්තුව ... ... ... | 500 | 0 |
| | | 1,850 | 0 |

**අතිරේක වැය**

| | | රු. | ශ. |
|---|---|---|---|
| සී 4 | නඩත්තු කිරීම ... ... | 1,000 | 0 |
| ඩී 2 (බී) | ගොන් කරත්ත සහ ලොරි ... ... | 850 | 0 |
| | | 1,850 | 0 |

නගර සභා කාර්යාලය,
වේයන්ගොඩ, 1966 අගෝස්තු මස 19 දින.

ජී. ජී. ඩී. ඇල්. තිලකරත්න,
වේයන්ගොඩ සුළු නගර සභාවේ සභාපති.

8-1273—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## වලස්මුල්ල සුළු නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවන පරිපූරක අය-වැය ලේඛනය

### ශීර්ෂය හා උප ශීර්ෂය

| | මුදල රු. | ශ. |
|---|---|---|
| ඩී.—මහජන සෞඛ්‍යය:— | | |
| 3. වැසිකිළි ශෝධනය— | | |
| (එච්) ඉදිකිරීම ... ... ... | 2,050 | 0 |
| 4. ගෝ ඝාතන ස්ථානය සහ ගව ගාල්— | | |
| (ඩී) ඉදි කිරීම ... ... ... | 120 | 0 |
| | 2,170 | 0 |

1966.5.10 දින මාසික රැස්වීමේ 5 වැනි යෝජනාවෙන්, මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ සංශෝධනයන්ට යටත්ව, අනුමත කරන ලදී.

ඩී .එච්. ජේ. විජේසූරිය,
සභාපති,
වලස්මුල්ල සුළු නගර සභාව.

1966.7.27 දින,
වලස්මුල්ල සුළු නගර සභා කාර්යාලයේදී.

අනුමත කරමි.

ඇම් .ඇල්. ඇම්. පෙරේරා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතර.

1966.8.12,
මාතරදී ය.

8–1289—66.8.26 දින අංක 14.710 දරන ගැසට් පත්‍රය

---

## කන්තලේ සුළු නගර සභාව

### මුදල් රෙගුලාසි අංක 40 (2) යටතේ කෙරෙන ඉල්ලුම් පත්‍රයයි

### 1966 අය-වැය ලේඛනය

**මුදල් ඉතිරි වැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඊ.—පොදු වියදම් .— | | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 400 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (ජී) වාහන තහඩු ගාස්තු ... ... | 49 | 15 |
| ඩී.—මහජන සෞඛ්‍ය .— | | |
| 7. වෙළඳ පොලවල් හා ගාල්— | | |
| (සී) මුද්‍රණය යනාදිය ... ... ... | 100 | 0 |
| 1. සාමාන්‍ය— | | |
| (එෆ්) විෂ බීජ නාශක ද්‍රව්‍ය ... ... | 50 | 0 |
| එකතුව ... | 599 | 15 |

**මුදල් අවශ්‍යවැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—පොදු වියදම් :— | | |
| 1. නිළධාරීන්ගේ වැටුප්— | | |
| (ඩී) කා. කා. ස. හා මුරකරු ... ... | 200 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (එෆ්) ලිපි ද්‍රව්‍ය මුද්‍රණය ප්‍රකාශන හා කාර්යාලීය වියදම් ... | 334 | 15 |
| ඩී.—මහජන සෞඛ්‍ය :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඇන්) මාතෘධාරකාභිවෘධි මධ්‍යස්ථානය ... | 15 | 0 |
| 2. කුනු කශල ශෝධනය— | | |
| (බී) කරත්ත ගොනුන් හා ලොරි ... ... | 50 | 0 |
| එකතුව ... | 599 | 15 |

වර්ෂ 1966 අය වැය ලේඛනයේ වර්ෂය අවසාන වන විට වැය නොවේ යයි ගණන් බලා ඇති මුදල් ඉහත දැක්වෙන ආකාර මුදල් අවශ්‍ය වැය ශීර්ෂයන්ට මාරු කිරීම ත්‍රිකුණාමලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව 1966 ජූලි මස 30 වෙනි දින පවත්වන්ට යෙදුන සභා රැස්වීමේදී අංක 3 දරණ යෝජනාවෙන් සභා සම්මත කරන ලදී.

එච්. ඩී. ඇල්. ලීලාරත්න,
සභාපති,
සුළු නගර සභාව, කන්තලේ.

1966 ක්වූ අගෝස්තු මස 3 දින,
කන්තලේ සුළු නගර සභා කාර්යාලයේ දිය.

අනුමත කරන ලදී.

ඇන්. සිවරාජා,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ත්‍රිකුණාමලය.

පළාත් පාලන දෙපාර්තමේන්තුව,
ත්‍රිකුණාමලය,
1966 අගෝස්තු මස 6 දින.

8-955/1—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

## 1966 අය-වැය ලේඛනය—සුළු නගර සභාව—කන්තලේ

### ඉතිරි විය හැකි මුදල් පිළිබඳ විස්තර

| ශීර්ෂ | උප ශීර්ෂ | වැය ශීර්ෂ අංකය | සේවයේ විස්තර | අය වැය ලේඛණයේ වෙන්කර ඇති මුදල රු. ශ. | අතිරේක වෙන් කිරීම රු. ශ. | වෙනස්වීම එකතුකිරීම හෝ අඩුකිරීම රු. ශ. | වෙන් කරනලද සම්පූර්ණ මුදල රු. ශ. | අද දක්වා වියදම් කරනලද මුදල රු. ශ. | වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු. ශ. | බලාපොරොත්තු වන ඉතිරිය අවශ්‍ය අතිරේකය රු. ශ. | හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒ | 1 | ඒ | ලේකම් වැටුප් | 2,895 0 | — | — | 2,895 0 | 1,276 50 | 2,895 0 | 400 0 | ලේකම් ධුරය මාස 2 ක් පුරප්පාඩුව තිබීම. |
| ඒ | 2 | ජී | වාහන තහඩු ගාස්තු | 100 0 | — | — | 100 0 | 50 85 | 100 0 | 49 15 | වර්ෂයටම අවශ්‍ය රථවාහන තහඩු ගෙන්වා ඇති නිසා මේ මුදල අවශ්‍ය නොවේ. |
| ඩී | 1 | එෆ් | විෂබීජ නාශක ද්‍රව්‍ය | 250 0 | — | — | 250 0 | — | 250 0 | 50 0 | වෙන්කර ඇති මුදල් ප්‍රමාණය වැය නොවේ. |
| ඩී | 7 | සී | මුද්‍රණය යනාදිය | 150 0 | — | — | 150 0 | — | 150 0 | 100 0 | වෙන්කර ඇති මුදල් ප්‍රමාණය වැය නොවේ. |
| | | | | | | | | | එකතුව | 599 15 | |

### අවශ්‍ය වී ඇති මුදල් පිළිබඳ විස්තරය

| ශීර්ෂ | උප ශීර්ෂ | වැය ශීර්ෂ අංකය | සේවයේ විස්තර | අය වැය ලේඛණයේ වෙන්කර ඇති මුදල රු. ශ. | අතිරේක වෙන් කිරීම රු. ශ. | වෙනස්වීම එකතුකිරීම හෝ අඩුකිරීම රු. ශ. | වෙන් කරනලද සම්පූර්ණ මුදල රු. ශ. | අද දක්වා වියදම් කරනලද මුදල රු. ශ. | වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රු. ශ. | බලාපොරොත්තු වන ඉතිරිය අවශ්‍ය අතිරේකය රු. ශ. | හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඒ | 1 | ඩී | කා. කා. සහායක සහ මුරකරු වැටුප් | 912 0 | — | — | 912 0 | 558 28 | 912 0 | 200 0 | රජයේ නිවාඩු හා පෝය නිවාඩු දිනවලට මුරකරුට අතිරේක වැටුප් ගෙවීම හා මුරකරු වෙනුවට කා. කා. සේ. වැඩ කරන විට වැඩිපුර වැටුප් දීම. |
| ඒ | 2 | ඇෆ් | ලිපි ද්‍රව්‍ය මුද්‍රණය ප්‍රකාශන හා කාර්‍යාලය වියදම් | 1,250 0 | — | — | 1,250 0 | 1,137 29 | 1,250 0 | 334 15 | ගෙන්වා ගන්නා ලද ලිපි ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවීම හා ඉදිරි කාලයට අවශ්‍ය මුද්‍රණය සඳහා. |
| ඩී | 1 | ඇන් | මාතෘදරකාභිවෘධි මධ්‍යස්ථාන | 6,000 0 | — | — | 6,000 0 | 364 0 | 6,000 0 | 15 0 | ගොඩනැගිල්ලට වෙන් කළ මුදල ඉවත් කළවිට ඉතිරිය දැනට ඇනවුම් කර ඇති කිරි වලට මුදල් ගෙවීමට ප්‍රමාණවත් නොවේ. |
| ඩී | 2 | බී | කරත්ත ගොනුන් හා | 300 0 | — | — | 300 0 | 108 07 | 300 0 | 50 0 | කැළි කශල කරත්තය අළුත් වැඩියා කිරීමට ඉතිරි මුදල ප්‍රමාණවත් නොවේ. |
| | | | | | | | | | එකතුව | 599 15 | |

එච්. ඩී. ඇල්. ලීලාරත්න,
සභාපති,
සුළු නගර සභාව, කන්තලේ.

සුළු නගර සභා කාර්‍යාලය,
කන්තලේ, 1966 අගෝස්තු මස 3 දින.

8–955/2—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## හපුතලේ නගර සභාව

### 1966 වර්ෂයේ හතරවැනි පරිපූරක අය-වැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම | | |
| (4) දීමනා හා ආධාර | 250 0 | 1966.7.18 දින අංක 11 දරණ යෝජනාව |
| එෆ්.—මහජන විනෝදය | | |
| (4) ක්‍රීඩාපිටිය සමතලා කිරීම | 25,000 0 | 1966.8.2 දින අංක 4 දරණ යෝජනාව |

ඇම්. එච්. සමයදස,
හපුතලේ නගර සභාපති.

1966.8.12 වෙනි දින,
හපුතලේ නගර සභා කාර්‍යාලයේදීය.

8–1296—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

## කෙහෙල්වත්ත සුළු නගර සභාව

### 1966 වර්ෂයේ පළමුවන පරිපූර්ණ අයවැය ලේඛනය

සාමාන්‍ය අංශය

| වැය ශීර්ෂය හා උප ශීර්ෂය | මුදල් රු. ශ. | සභාවේ අනුමැතිය |
|---|---|---|
| ඒ. (2) සංස්ථා වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු ... ... ... ... | 1,200 0 ... | 1966.7.10 දින අංක 21 (3) |
| (එච්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ සහ මුද්දර ගාස්තු ... ... ... | 3,000 0 ... | 1966.4.11 දින අංක 14 |
| බී. මංමාවත්— | | |
| (ඒ) ප්‍රතිසංස්කරණ ... ... ... ... | 2,849 0 ... | 1966.6.12 දින අංක 10 |
| (සී) නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | | |
| (4) නඩත්තු කිරීම ... ... ... ... | 5,620 12 ... | 1966.6.12 දින අංක 22 (1) |
| සී. මහජන සෞඛ්‍යය— | | |
| (1) සාමාන්‍ය | | |
| (එජ්) විෂබීජ නාශක ද්‍රව්‍ය ... ... ... | 2,000 0 ... | 1966.6.12 දින අංක 14 |
| (2) කසල ශෝධනය | | |
| (බී) කරත්ත, ගොනුන් ... ... ... ... | 750 0 ... | 1966.6.12 දින අංක 18 (1) |
| (සී) උපකරණ ... ... ... ... | 150 0 ... | 1966.6.12 දින අංක 18 (2) |
| (7) වෙළඳ පොලවල් ... | | |
| (බී) නඩත්තු කිරීම ... ... ... ... | 1,931 66 ... | 1966.6.12 දින අංක 22 (1) |
| (බී) නඩත්තු කිරීම ... ... ... ... | 2,000 0 ... | 1966.7.10 දින අංක 21 (1) |
| | 19,500 78 | |

සුළුනගර සභා කාර්යාලය,
කෙහෙල්වත්ත, පානදුර

ඩර්වින් එස්. පෙරේරා,
සභාපති,
කෙහෙල්වත්ත සුළු නගර සභාව.

8–1298—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## මිනුවන්ගොඩ සුළු නගර සභාව

### 1966 තෙවන පරිපූරක අයවැය ලේඛනය

| වැය ශීර්ෂය | | ගණන රු. ශ. |
|---|---|---|
| සී. මහජන සෞඛ්‍ය | | |
| (7) වෙළඳපොලවල් හා ගාල් ... | සී. ඉදිකිරීම | 10,000 0 |

1966 අගෝස්තු මස 20 වන දින පැවැත්වුණු මිනුවන්ගොඩ සුළු නගර සභාවේ විශේෂ සභා රැස්වීමේ අංක 1 දරණ යෝජනාවෙන් ඉහත සඳහන් පරිපූරක අයවැය ලේඛණය සභා සම්මත විය.

සී. ඩී. විජේතුංග,
සභාපති,
මිනුවන්ගොඩ සුළු නගර සභාව.

1966 අගෝස්තු මස 21 වන දින,
මිනුවන්ගොඩ සුළු නගර සභා කායර්‍ාලයේ දී ය.

8–60—66.8.26 දින අංක 14,710 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## අඹන්පොල ගම්ප්‍රදේශයේ අඹන්පොල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1966 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව අඹන්පොල ගම්සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ සඳහා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම්දෙමි.

එච්. ඇම්. රත්හාමි,
අඹන්පොල ගම්සභාපති.

ගම්සභා කායර්‍ාලය,
අඹන්පොල, 16.8.66.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| මහමදුලෙබ්බෙගේ අබ්දුල්මජීද ... | අඹන්පොල ඒ. ඇම්. සකාප්ගේ ගෙය | හරක්මස් |

8–1284—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## හලාවත දිස්ත්‍රික්කයේ කාක්කාපල්ලිය ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1966 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බවත් එම බලපත්‍රය නිකුත්කිරීම ගැන කාක්කාපල්ලිය ගම් ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණක් සඳහා ද යනවග සඳහන් කර ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත පනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| එච්. ඇම්. සම්ම් මරික්කාර්, සවරාන, හලාවත... | සවරාන ... | හරක් මස් |

ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු,
කාක්කාපල්ලිය ගම් සභාවේ සභාපති.

1966.8.16,
කාක්කාපල්ලිය ගම්සභා කාර්යාලයය,
කාක්කාපල්ලිය.

8–1286—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

## කුලියාපිටිය නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් ඒ අයගේ නම ඉදිරියෙන් සඳහන් ස්ථානයෙහි 1966 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීමට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම්පතක් ඉදිරිපත්කර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කුලියාපිටිය නගර සභා සීමාව තුළ යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඈ එසේ විරුද්ධ වන්නේ අසුවල් කරුණු මතයයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත දී මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය |
|---|---|
| පී.ඩී. බැසිල් අප්පුහාමි මයා., දුම්මලසූරිය, කට්ටිමහන | ඌරුමස් කඩය, කුලියාපිටියේ හෙට්ටිපොල පාරේ අංක 181 දරණ ස්ථානය |

ලයනල් ජයතිලක,
කුලියාපිටිය නගර සභාවේ සභාපති.

1966 අගෝස්තු මස 10 වන දින,
කුලියාපිටිය නගර සභා කාර්යාලයේදී.

8–1291—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## 1952 කෝ් අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන මෙහි පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ :—

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ, 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට 37 දක්වාවූ (1 සහ 37 ඇතුළුව) කාණ්ඩ මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කරගැනීමට නිවිතිගල ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ.

එච්. සිරිවර්ධනහාමි,
නිවිතිගල ගම්සභාවේ සභාපති.

1966 අගෝස්තු 5 වැනි දින,
නිවිතිගල පිහිටි ගම්සභා කායර්ාලයේදී ය.

8–1290—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## කන්තලේ සුළු නගර සභාව

### නිවාස සැපයීමේ හා නගර වැඩිදියුණු කිරීමේ ආඥාපනත

### (268 වැනි අධිකාරය)

කන්තලේ සුළු නගර සභා සීමාව තුළ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට/නැවත ඉදිකිරීමට හෝ වෙනස් කිරීමට යම් කෙනෙක් බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ (199 වැනි පරිචෙඡ්දය) 5 සහ 6 (1) වැනි වගන්ති යටතේ මගේ අනුමතිය ලබාගත යුතු බව මෙයින් දන්වමි.

මගේ අනුමතිය නොමැතිව යම් කෙනෙක් කිසිම ගොඩනැගිල්ලක් ඉදිකෙරේ නම්/නැවත ඉදි කෙරේ නම් හෝ වෙනස් කෙරේ නම් ඔහුට විරුද්ධව ඉහත කී ආඥාපනතේ ප්‍රකාර නීති මගින් ක්‍රියා කිරීමට සිදුවන බවද දන්වා සිටිමි.

ගොඩනැගිල්ලක් ඉදිකිරීමට/නැවත ඉදිකිරීමට හෝ වෙනස් කිරීමට උවමනා නම් සුළු නගර සභා කාර්යාලයෙන් කාර්යාලීය වේලාවන්හිදී ලබාගත හැකි ගොඩනැගිලි අයදුම් පතක් ලබාගෙන එය සම්පූර්ණකර මගේ අනුමතිය සඳහා ඉදිරිපත් කළ යුතු බව මෙයින් දන්වා සිටිමි.

එච්. ඩී. ඇල්. ලීලාරත්න,
සභාපති,
කන්තලේ සුළු නගර සභාව.

1966 අගෝස්තු මස 12 දින,
කන්තලේ සුළු නගර සභා කාර්යාලයේදීය.

8–1300—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

---

## යටකලන් පත්තු ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ නම සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථානයේ 1966 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන හලාවත දිස්ත්‍රික්කයේ යටකලන් පත්තු ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම් එය විස්තර සහිතව ලියවිල්ලකින් පිටපත් දෙකක් සිටින සේ සකස්කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවුන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බැව් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇල්. පී. මැන්ඩිස්, කොස්වාඩිය, මහවැව ... | හරක් මස්, එළු මස් සහ ඌරු මස් | කොස්වාඩියේ පිහිටුවා තිබෙන අංක 5 දරණ මස් කඩය. |

ඒ. වික්‍රමආරච්චි,
ගම්සභාපති,
යටකලන් පත්තු ගම් සභාව.

1966.8.19 වැනි දින,
ගම්සභා කාර්යාලය,
හත්තිනිය, මාරාවිල.

8–1277—66.8.26 දින අංක 14,710 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.**

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා **අන්තිම දින සහ වේලාවන් පහත පළකර** ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකල යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන **වේලාවක් දී** තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ **පහසුවටද හේතුවන බව සලකන්න.**

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් බාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**ශුභලේඛනය**

**1966**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | ... | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

**1966 ජූලි 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

බර්නාඩ් ද සිල්වා,
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි